# මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අධ්‍යයන වර්ෂය 2019/2020 වෙනුවෙන් මොරටුව විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය

## වාස්තු විද්‍යාව උපාධි පාඨමාලාව, නිර්මාණවේදය උපාධි පාඨමාලාව, භූමි නිර්මාණවේදය උපාධි පාඨමාලාව (වාස්තු විද්‍යා පීඨය), විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය උපාධි පාඨමාලාව (ඉංජිනේරු පීඨය) යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා යෝග්‍යතා පරීක්ෂණ වලට අයදුම් කිරීම

**1.** 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් ඇතුලත් කිරීම පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අත් පොතෙහි **අංක 1.2** දරණ කොටස යටතේ සඳහන් කර ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙතින් ඉහත සඳහන් යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**මෙම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අන්තර්ජාලය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අමතරව මෙම යෝග්‍යතා පරීක්ෂණ වලටද අයදුම් කර පෙනී සිට ඉන් සමත්විය යුතුය.**

ඉහත සඳහන් පාඨමාලා 04 ට අදාළ යෝග්‍යතා පරීක්ෂණවලට පෙනී සිටීම සඳහා අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා යටතේ පහතින් සඳහන් කර ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**2.** **(අ) වාස්තු විද්‍යාව උපාධි පාඨමාලාව (වාස්තු විද්‍යා පීඨය)**

අ.පො.ස. (උසස් පෙළ) 2019 විභාගයට පෙනී සිට ඇති අපේක්ෂකයින් විසින් (**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අත්පොත 2019/2020 හි අංක 1.2 සහ 2.2.8.6 ඡේද බලන්න**).

(i) පහත දැක්වෙන විෂයයන් අතුරින් **අවම වශයෙන් එක් විෂයයකට**

| | | |
|---|---|---|
| චිත්‍ර | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | | |

**සහ**

(ii) පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරාගත් **අනෙක් විෂයය/විෂයන්ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.**

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | හින්දි | අරාබි |
| හින්දු ශිෂ්ඨාචාරය | බෞද්ධ ශිෂ්ඨාචාරය | ඉතිහාසය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ගෘහ ආර්ථික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයන |
| ඉස්ලාම් ශිෂ්ඨාචාරය | චීන | ජපන් |
| ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරය | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | ආර්ථික විද්‍යාව |
| දේශපාලන විද්‍යාව | ගණිතය | පාලි |
| ඉංග්‍රීසි | සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | ජර්මන් | දෙමළ |
| ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කෘෂි විද්‍යාව |
| සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය | | |

සටහන 1

**ඉහත (i) යටතේ දක්වා ඇති විෂයය ලැයිස්තුවට ඇතුලත් විෂයයන් අතුරින් විෂයයන් තුනක් සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ට ද ඉහත සඳහන් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම් කළහැකිය.**

**ඊට අමතරව** සියළුම අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතාවන්ද සපුරා තිබිය යුතුය.

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට, අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගණිතය විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

## (ආ) නිර්මාණවේදය උපාධි පාඨමාලාව (වාස්තු විද්‍යා පීඨය)

නිර්මාණවේදය උපාධි පාඨමාලාවට සුදුසුකම් ලැබීම සඳහා අපේක්ෂකයකු අ.පො.ස (උසස් පෙළ) 2019 විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා තිබිය යුතුය. (**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අත්පොත 2019/2020 හි අංක 1.2 සහ 2.2.8.9 ඡේද බලන්න**).

**ඊට අමතරව** සියළුම අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතාවන්ද සපුරා තිබිය යුතුය.

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට, අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඇ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී විද්‍යාව විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

## (ඇ) භූමි නිර්මාණවේදය උපාධි පාඨමාලාව (වාස්තු විද්‍යා පීඨය)

අ.පො.ස. (උසස් පෙළ) 2019 විභාගයට පෙනී සිට ඇති අපේක්ෂකයින් විසින් (**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අත්පොත 2019/2020 හි අංක 1.2 සහ 2.2.8.8 ඡේද බලන්න**).

(i) පහත දැක්වෙන විෂයයන් අතුරින් **අවම වශයෙන් එක් විෂයකට**:

| | | |
|---|---|---|
| චිත්‍ර | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | කෘෂි විද්‍යාව | |

**සහ**

**(ii)** පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරාගත් **අනෙක් විෂයය / විෂයයන්ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.**

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | හින්දි | අරාබි |
| හින්දු ශිෂ්ඨාචාරය | බෞද්ධ ශිෂ්ඨාචාරය | ඉතිහාසය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ගෘහ ආර්ථික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයන |
| ඉස්ලාම් ශිෂ්ඨාචාරය | චීන | ජපන් |
| ග්‍රීක සහ රෝම ශිෂ්ඨාචාරය | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | ආර්ථික විද්‍යාව |
| දේශපාලන විද්‍යාව | ගණිතය | පාලි |
| ඉංග්‍රීසි | සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | ජර්මන් | දෙමළ |
| සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය | ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

**සටහන 2**

**ඉහත (i) යටතේ දක්වා ඇති විෂයය ලැයිස්තුවට ඇතුලත් විෂයයන් අතුරින් විෂයයන් තුනක් සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ට ද ඉහත සඳහන් යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම් කළහැකිය.**

ඊට අමතරව සියළුම අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතාවන්ද සපුරාලිය යුතුය.

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදි ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදි ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදි ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

## (ඇ) විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය උපාධි පාඨමාලාව (ඉංජිනේරු පීඨය)

විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය උපාධි පාඨමාලාවට සුදුසුකම් ලැබීම සඳහා අපේක්ෂකයකු අ.පො.ස (උසස් පෙළ) 2019 විභාගයේදි ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා තිබිය යුතුය. (**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අත්පොත 2019/2020 හි අංක 1.2 සහ 2.2.8.7 ඡේද බලන්න**).

**ඊට අමතරව** සියළුම අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතාවන් සපුරා තිබිය යුතුය.

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදි ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

## 3. විභාග පැවැත්වෙන දිනයන්

**වාස්තු විද්‍යාව , භූමි නිර්මාණවේදය , නිර්මාණවේදය (වාස්තු විද්‍යා පීඨය) , විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය (ඉංජිනේරු පීඨය) යන පාඨමාලාවන් සඳහා යෝග්‍යතා පරීක්ෂණය 2020.08.15 සහ 2020.08.16 යන දිනයන්හිදි පැවැත්වේ.**

## 4. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම

**අයදුම්කරුවන් මොරටුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන http://www.uom.lk හි ඇති මාර්ගගත (Online) අයදුම්පත්‍රය සම්පූර්ණ කල යුතු අතර ඒමගින් ඔබ විසින් බාගත (Download) කරගනු ලබන සම්පූර්ණ කරන ලද අයදුම්පත, රිසිට් පත, මුද්දර සහිත ලියුම් කවරයක් හා අදාළ ප්‍රතිඵල ලේඛන සමග ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.**

ඉදිරිපත් කරන අයදුම්පත සමග ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ලබාගත් මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපති නමට (**ගිණුම් අංකය 306836 - කටුබැද්ද ශාඛාව)** නිකුත් කල ගෙවීම් වවුචරයක් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් එවිය යුතුය. එක් පාඨමාලාවක් සඳහා රු.600/- බැගින් අයකරනු ලැබේ. උදා:- ඔබ එක් පාඨමාලාවකට අයදුම් කරන්නේ නම් රු.600/- ක් ද, පාඨමාලා දෙකකට අයදුම් කරන්නේ නම් රු.1200/- ක් ද, පාඨමාලා තුනකට අයදුම් කරන්නේ නම් රු.1800/- ක් ද පාඨමාලා හතරකට අයදුම් කරන්නේ නම් රු.2400/- ක් බැගින් ගෙවීම් කල යුතුය. **(චෙක්පත් සහ තැපැල්/මුදල් ඇනවුම් භාරගනු නොලැබේ.)** එයට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ) සහතිකවල සහ පොදු පරීක්ෂණ ප්‍රශ්ණ පත්‍රයෙන් සමත් බව සඳහන් **සහතිකයේ පිටපත්**, මුද්‍රිත අයදුම් පත්‍රයත් සමගම ස්වකීය **විදුහල්පති හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු ලවා සහතික කර** අමුණා එවිය යුතුය. සහතික කරනු ලබන සහතික පිටපත් වල සහතික කරන්නාගේ නිල මුද්‍රාව තබා තිබිය යුතුය. වෙබ් අඩවියෙන් ලබා ගන්නා ලද අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල ලේඛනය ඉදිරිපත් කරන්නේ නම් අයදුම්කරුගේ නම ප්‍රතිඵල ලේඛනයට ඇතුලත් කර එය විදුහල්පති විසින් සත්‍ය පිටපතක් බවට සහතික කර විදුහල්පතිගේ නිල මුද්‍රාව සහිතව ඉදිරිපත් කළ යුතුය. **සහතික පත්‍රවල මුල් පිටපත් එවීමෙන් වලකින්න.** අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත සමග සෙ. මී. $10^1/_2$X 22 $^1/_2$ (අඟල් 9 X 4) ප්‍රමාණයේ අයදුම්කරුගේ ස්වකීය **ලිපිනය ලියන ලද ලියුම් කවරයක රු.55/- ක් වටිනා මුද්දර අලවා එවීම අනිවාර්යය වේ.** එම ලිපි කවරයේ යෝග්‍යතා පරීක්ෂණයට අදාල ප්‍රවේශ පත්‍රය බහා ආපසු අයදුම්කරු වෙත තැපැල් කෙරෙන බැවින් එහි ප්‍රවේශ පත්‍රය ලැබිය යුතු **නිවැරදි ලිපිනය සඳහන් කර** එවිය යුතුය.

**සැලකිය යුතුයි**

I. අයදුම්පතෙහි සහ සහතිකවල සඳහන් නම් අතර වෙනසක් ඇත්නම් එම නම් වලින් හැඳින්වෙන්නේ එකම පුද්ගලයෙකු බවට දිවුරුම් පෙත්සමක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

II. ඉහත සඳහන් යෝග්‍යතා පරීක්‍ෂණ සඳහා ප්‍රවේශ පත්‍රසුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත ලිපි මගින් දැනුම් දෙනු ඇත. (ඔබ විසින් ලිපිනය සඳහන් කර අප වෙත යොමුකල මුද්දරය ඇල වූ ලියුම් කවරය මේ සඳහා භාවිතා කරනු ලැබේ.)

III. අපේක්ෂකයා විසින් අවම සුදුසුකම් සපුරා නොමැති නම් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

IV. පහත දක්වා ඇති කරුණු මත ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප විය හැක.

(අ) මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) අසම්පූර්ණ වී තිබීම.

(ආ) මුද්‍රිත අයදුම්පත්‍රය සහ ගෙවීම් වවුචරය අදාල ලිපිලේඛණ සමග අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් මොරටුව විශ්වවිද්‍යාලයීය විභාග අංශය වෙත නොලැබීම.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්‍ෂිත අවම ප්‍රවේශ අවශ්‍යතා සපුරා නොතිබීම හා යෝග්‍යතා පරීක්‍ෂණයකට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම.

V. යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම පමණක් උපාධි පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකමක් නොවේ.

VI. අපේක්ෂකයා විසින් මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) යොමුකිරීමෙන් පසුව කිසිදු වෙනස්කමක් කිරීමට නොහැකි බැවින්, එය සම්පූර්ණ කිරීමේදී සියළු කරුණු නිවැරදිදැයි තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් අයදුම්පත්‍රය යොමුකල යුතුය.

<u>බාගතකරන ලද අයදුම්පත (Downloaded Application) ලියාපදිංචි තැපැලෙන් 2020.06.19 දින හෝ ඊට පෙර</u> **නියෝජ්‍ය ලේඛකාධිකාරී / විභාග අංශය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව** යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

**<u>අයදුම්පත් බහා එවන කවරයේ ඉහල වම් කෙළවරේ යෝග්‍යතා පරීක්ෂණ-2020 යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.</u>**

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.**

**විශේෂ නිවේදනයයි**

යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාම ලේඛණයක් මොරටුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙහි 2020.08.11 වන දින පළකරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍රය 2020 අගෝස්තු මස 13 වන දින වන විට නොලද, එහෙත් යෝග්‍යතා පරීක්ෂණයට සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතොත්, සහ වැඩි දුර තොරතුරු දැන ගැනීම සඳහා පහත සඳහන් ඊමේල් ලිපිනය මගින් විමසන්න.

ඊමේල් - admissions@uom.lk

ලේඛකාධිකාරී,
මොරටුව විශ්වවිද්‍යාලය,
කටුබැද්ද,
මොරටුව.

2020.06.11